# ශ්‍රී ලංකා ඇඟළුම් කර්මාන්තය තුළ ශ්‍රම හිඟය

*සුනිමලී මදුරාවල*

ශ්‍රී ලංකාවේ අපනයන ඉලක්ක කර ගත් කර්මාන්ත අතරින් ඇඟළුම් කර්මාන්තය සාපේක්ෂව නව කර්මාන්තයක් වේ. නමුත් රටට විදෙස් ආදායම් මාර්ගයක් වශයෙන් මෙන් ම රැකියා උත්පාදනය අතිනුත් එය ශ්‍රී ලංකා ආර්ථිකය තුල ඉටු කරන කාර්ය භාරය අති මහත්ය. විශේෂයෙන් ම ඇඟළුම් කර්මාන්තය කාන්තාවන්ට රැකියා සපයන වැදගත් මූලාශ්‍රයක් වශයෙන් පසුගිය දශක කීපය පුරාම වැදගත් සේවයක් කර ඇත. තවද ශ්‍රී ලංකාවේ නාමය ඉතා උසස් තත්වයේ ඇඟළුම් සඳහා ලෝක පූජිත සන්නාම නාමයක් බවට පත් කිරීමටද හැකියාව එයට ලැබී ඇත. ඉතා තරඟකාරී ලෝක වෙළඳ පොළක් තුළ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා ඇඟළුම් කර්මාන්තය තුළ වැඩි වශයෙන් සේවා නියුක්තව සිටින්නේ කාන්තාවන්ය. කෙසේ වෙතත් ශ්‍රී ලංකා ඇඟළුම් කර්මාන්තය වසර කීපයක සිට ශ්‍රමය සම්පාදනය කර ගැනීමේ ගැටළුවකට මුහුණ පා ඇති අතර මෙම තත්වය වැඩි වශයෙන් දකින්නට ඇත්තේ 'මැෂින් ක්‍රියාකරවන්නියන්' සඳහා ය. මෙම තත්වය යටතේ මෑතකදී සිදු කරන ලද අධ්‍යයනයක්** මගින් මෙම ශ්‍රම හිඟයට බලපාන හේතු සාධක මෙන්ම එය අවම කර ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ගද විමසුමට ලක් කර ඇත.

## ශ්‍රී ලංකා ඇඟළුම් කර්මාන්තය

ශ්‍රී ලංකා ඇඟළුම් කර්මාන්තයට ඉතා දිගු ඉතිහාසයක් ඇති නමුත් එය ශ්‍රී ලංකාවේ විශාලතම කර්මාන්තය වශයෙන් වර්ධනය වූයේ 1970 දශකයේ අග භාගයෙන් පසුවය. මෙම වර්ධනයට හේතු වූ ප්‍රධාන සාධක තුනකි; 1977 දී හඳුන්වා දුන් වෙළඳ පොළ කේන්ද්‍ර කර ගත් නිදහස් ආර්ථික ප්‍රතිපත්තීන් ශ්‍රී ලංකා අයෝජන මණ්ඩලය (Export Development Board) මගින් ගනු ලැබූ දිරි ගැන්වීම්, සහ Multi-Fiber Agreement වැනි වෙළඳ ගිවිසුම් යටතේ ලැබුන සහන මෙම ප්‍රධාන සාධක වේ. වෙළඳ පොළ කේන්ද්‍ර කර ගත් ලිබරල් ආර්ථික ප්‍රතිපත්තීන් යටතේ අපනයනය ඉලක්ක කර ගත් කර්මාන්ත සඳහා විවිධ සහන ලබා දීමෙන් ඒවාට විශාල වැදගත් කමක් ලබා දුන් අතර ප්‍රවර්ධනය කිරීමද සිදු විය. ඉහළ අධ්‍යාපන මට්ටමක් ඇති ශ්‍රමිකයන් සාපේක්ෂව අඩු පිරිවැයක් යටතේ ලබා ගත හැකි වීම නිසා ද ශ්‍රී ලංකාවට විදේශ ආයෝජකයන් ආකර්ෂණය විය. මෙවන් පසුබිමක් තුල ඇඟළුම් කර්මාන්තය ශ්‍රී ලංකාව තුළ හොඳින් ස්ථාපිත වූ අතර එතැන් සිට ඇඟළුම් කර්මාන්තය ශ්‍රී ලංකා ආර්ථිකයට අපනයන ආදායම් උත්පාදනය කරන්නෙකු ලෙසත් රැකියා අවස්ථා ජනනය කරන්නෙකු ලෙසත් ඉතා සුවිශේෂී දායකත්වයක් ලබා දෙයි. වර්ෂ 2015 මහ බැංකු වාර්තාවට අනුව 2015 වර්ෂය තුළ රටේ සමස්ත අපනයන ආදායම ඇමරිකානු ඩොලර් මිලියන 10,505ක් වූ අතර එයින් සියයට 46ක්ම ලැබී තිබුනේ ඇඟළුම් කර්මන්ත අංශයෙනනි' පසුගිය වර්ෂ ගණනාවක් පුරාම ඇඟළුම් කර්මාන්තය ඉපැයූ සමස්ත අපනයන ආදායම වර්ධනය වීමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කල අතර එය වර්ෂ 2016දී ඇමරිකානු

ඩොලර් මිලියන 4,674ක් දක්වා වැඩි විය' මීට අමතරව සෘජු රැකියා අවස්ථා 300,000 සහ වක්‍ර රැකියා අවස්ථා 600,000 පමණත් සම්පාදනය කිරීමට ශ්‍රී ලංකා ඇඟළුම් කර්මාන්තයට හැකියාව ලැබී ඇත'

## ශ්‍රී ලංකා ඇඟළුම් කර්මාන්තය තුළ කාන්තා දායකත්වය

ආරම්භයේ පටන්ම ඇඟළුම් කර්මාන්තයේ වැඩි වශයෙන් සේවා නියුක්තව සිටිනුයේ කාන්තාවන්ය. ඇත්ත වශයෙන් ම ඇඟළුම් කර්මාන්තය තුළ සේවා නියුක්ත වුවන්ගෙන් සියයට 80 ක් පමණ කාන්තාවන්ය. මෙය රටේ සමස්ත ශ්‍රම බලකායෙන් කාන්තාවන්ට හිමි වන සියයට 35 ට වඩා සැලකිය යුතු ඉහළ අගයකි. ඇඟළුම් ක්ෂේත්‍රයේ සේවා නියුක්ත බහුතරය කාන්තාවන් වුවත් ඔවුන් බොහෝ විට පහල මට්ටමේ රැකියාවන්ට සීමා වී සිටිනු දැකිය හැකි අතර ඉහළ කළමණාකාරීත්ව රැකියාවල වැඩි වශයෙන් නිරත වී සිටින්නේ පුරුෂයන්ය.

ශ්‍රී ලංකාවේ ඇඟළුම් කර්මාන්තය තුළ ශ්‍රම හිඟය ප්‍රධාන අභියෝගයක් බවට පත් වී ඇත. මෙම ගැටළුව කෙතරම් බැරෑරුම් තත්වයකට පත් වී ඇත්ද යන්න නිෂ්පාදන ක්‍රියාවලිය යාන්ත්‍රීකරණය කිරීමට ඉදිරිපත් වී ඇති යෝජනා තුළින් ම පැහැදිලි වේ. මෙම ශ්‍රම හිඟය වැඩි වශයෙන්ම දක්න්නට ඇත්තේ කාන්තාවන් වැඩි වශයෙන් සේවා නියුක්තව සිටින 'මැෂින් ක්‍රියාකරවන්නියන්' යන වෘත්තීය කාණ්ඩය සඳහාය. ජාතික වශයෙන් ගත් කල පුරුෂයන්ට සාපේක්ෂව ඉතා පහළ ශ්‍රම සහභාගීත්ව අනුපාතයක් සහ ඉහළ රැකියා වියුක්ත අනුපාතයක් කාන්තාවන් අතර දකින්නට ඇති අතර (වර්ෂ 2017 දී කාන්තා ශ්‍රම සහභාගීත්ව අනුපාතය සියයට 35ක් වූ අතර රැකියා වියුක්ත අනුපාතය සියයට 7.6ක් විය. පුරුෂයින් සඳහා මෙම අගයන් පිළිවෙලින් සියයට 75ක් සහ සියයට 3ක් විය) මෙවැනි පසුබිමක් තුළ කාන්තාවන්ට වැඩි ඉල්ලූමක් ඇති ඇඟළුම් ක්ෂේත්‍රය ශ්‍රම හිඟයකට මුහුණ පා සිටීම තරමක් පුදුම සහගත සිදුවීමක් වේ.

## ශ්‍රම හිඟයට හේතු

ඇඟළුම් ක්ෂේත්‍රය කෙරෙහි කාන්තාවන් ආකර්ෂණය කර ගැනීමේ අසීරුතාවය සඳහා හේතු වන කරුණු ගණනාවක් ඇත. ඇඟළුම් කර්මාන්තය මුහුණ දෙන ශ්‍රම හිඟය සම්බන්ධයෙන් අදහස් දැන ගැනීමට ඇඟළුම් කර්මාන්තය හා සම්බන්ධ මානව සම්පත් කළමණාකරුවන් කීප දෙනෙකු සමග සම්මුඛ සාකච්ඡා කීපයක් පවත්වන ලදී. එම සම්මුඛ සාකච්ඡා ඇසුරින් පෙනී ගියේ අනෙකුත් ක්ෂේත්‍රයන්ගෙන් එල්ල වන තරඟකාරීත්වය, රැකියා ස්ථාන වෙත ලඟා වීමේ අපහසුතා, අයහපත් සමාජ පිළිගැනීම, සහ වෘත්තීය අපේක්ෂාවන් වෙනස් වීම යන කරුණු මෙම ගැටළුව සඳහා මූලික වශයෙන් බලපාන බවයි

***අනෙකුත් ක්ෂේත්‍රයන්ගෙන් එල්ල වන තරඟකාරීත්වය :*** වර්තමානයේදී ශ්‍රමිකයන් ආකර්ෂණය කර ගැනීම සඳහා ඇඟළුම් කර්මාන්තයට අනෙකුත් ක්ෂේත්‍රයන් සමග දැඩි තරඟයක නියුක්ත වීමට සිදු වී ඇත. විශේෂයෙන්ම සංචාරක කර්මාන්තය, සිල්ලර වෙළඳාම් අංශය වැනි ක්ෂේත්‍ර වලින් විශාල තරඟකාරීත්වයක් එල්ල වී ඇත. සමස්තයක් වශයෙන් සලකා බලන කල මෙම විකල්ප ක්ෂේත්‍රයන් පිරිනමන වැටුප සාපේක්ෂව ඇඟළුම් ක්ෂේත්‍රයට වඩා ඉහළ මට්ටමක පවතී. කෙසේ නමුදු කාන්තාවන්

අනෙකුත් අංශ කරා යොමු වීමට හේතු වන්නේ ඉහළ වැටුප පමණක් නොවේ. වැඩ කරන පරිසරය ද මේ සඳහා ඉමහත් ලෙස බලපායි. වෘත්තීමය පරිසරයක් තුළ තිබිය යුතු මූලික අවශ්‍යතා මෙන්ම අනෙකුත් පහසුකම් ද ශ්‍රමිකයන්, විශේෂයෙන් ම කාන්තාවන් ආකර්ෂණය කර ගැනීමේ දී වැදගත් වේ.

***සංචලතාවය :*** සේවා ස්ථාන පදිංචි ස්ථානයට ආසන්නයේ පැවතීම මෙන්ම ඒවාට පහසුවෙන් ලඟා වීමට ඇති හැකියාවත් කාන්තාවන් රැකියාවක් තොරා ගැනීමේ දී සලකා බලන වැදගත් කරුණු වේ. විවාහක සහ දරුවන් සිටින කාන්තාවන් සම්බන්ධයෙන් මෙම කාරණය ඉතා වැදගත් වේ. මෙවැනි කාන්තාවෝ ඔවුන් වෙත පැවරී ඇති පවුලේ වගකීම් නිසා වෙනත් දුර බැහැර නාගරීක ප්‍රදේශ වල නැවතී රැකියාව කිරීමට මැලි කමක් දක්වති. අවිවාහක කාන්තාවන් පවා ඇඟළුම් කර්මන්තශාලා වැඩි වශයෙන් ස්ථානගත වී ඇති නාගරීක ප්‍රදේශ වෙත සාංක්‍රමණය වීමට මැලිකමක් දක්වන්නේ ආරක්ෂිත නවාතැන් පහසුකම් සොයා ගැනීමේ දුෂ්කරතාවය නිසාය.

***අයහපත් සමාජ පිළිගැනීම :*** ඇඟළුම් ක්ෂේත්‍රයේ රැකියා නියුක්ත කාන්තාවන් පිළිබඳව සමාජය තුළ ඇති වී තිබෙන අයහපත් ආකල්පය නිසා ද බොහෝ කාන්තාවන් මෙම ක්ෂේත්‍රයෙන් දුරස් වී ඇත. ඇඟළුම් කර්මාන්තශාලා වන්හි සේවය කරන කාන්තාවන් 'ජුකී කෙල්ලන්' වැනි යෙදුම් වලින් හැඳින්වීමත් ඔවුන් පහත් කොට සැලකීමත් වැනි සමාජීය තත්වයන් නිසා කාන්තාවන් ඇඟළුම් ක්ෂේත්‍රයේ රැකියාවන් සඳහා යොමු වීමට පසුබට වන ආකරයක් දැකිය හැක. මෙවැනි අයහපත් සමාජ පිළිගැනීමක් නිර්මාණය වීමට ඇඟළුම් ක්ෂේත්‍රයේ රැකියා නියුක්ත කාන්තාවන්ට මුහුණ දෙන ආරක්ෂාව පිළිඹඳ ගැටලු, සහ අඩු පහසුකම් (ප්‍රවාහන, නවාතැන් ) තුළින් පැන නගින ලිංගික අපහරණයන් සහ අපයෝජනයන් හේතු වී ඇත. ඇඟළුම් ක්ෂේත්‍රයට සාපේක්ෂව අනෙකුත් ව්‍යාපාරයන් තුළ මෙවැනි තත්වයක් දකින්නට නොමැති අතර ඒවාට ඇති සමාජ හා රැකියා පිළිගැනීම ද වැඩිය.

***නව පරපුරේ රැකියා අපේක්ෂාවන් වෙනස් වීම:*** ඇඟළුම් කර්මාන්තය මෙරට ආරම්භ කරන කාලයේදී එයට සම්බන්ධ වූ කාන්තාවන් මෙන් නොව වර්තමාන කාන්තවන්ගේ අධ්‍යාපනය උසස් මට්ටමක පවතී. ඔවුන් බොහෝ විට අ.පො.ස. සාමාන්‍යය පෙළ සුදුසුකම් සපුරා ඇත. අධ්‍යාපන මට්ටම උසස් වීමත් සමඟම ඔවුන්ගේ රැකියා අපේක්ෂාවන් ද වෙනස් වී ඇත. ඔවුන් ඇඟළුම් කර්මාන්ත ශාලා ආශ්‍රිත රැකියාවන් මහන්සි වී වැඩ කල යුතු, ඒකාකාරී රැකියාවන් ලෙස දකින අතර තව දුරටත් ඒවා ආකර්ෂණීය රැකියා ලෙස නොදකී. නමුත් වඩා වැඩි සමාජ පිළිගැනීමක් සහ නම්‍යශීලීත්වයක් ඇති පරිගණක ආශ්‍රිත රැකියා සඳහා තරුණ පරපුර වැඩි වශයෙන් ආකර්ෂණය වීමේ නැඹුරුවක් දකින්නට ඇත.

## ඇඟළුම් ක්ෂේත්‍රයේ ශ්‍රම හිඟයට පිළියම්

ශ්‍රී ලංකා ඇඟළුම් කර්මාන්තය ජාත්‍යන්තර වෙළඳ පොළ තුළ මුහුණ දෙන දැඩි තරඟකාරීත්වය සලකා බැලීමේදී එම අංශය මුහුණ පා සිටින ශ්‍රම හිඟයට ඉක්මන් පිළිතුරක් සොයා ගැනීම ඉතා වැදගත් වේ. තරඟකාරී වැටුප් පිරිනැමීම, වඩාත් ආකර්ෂණීය වැඩ බිම් පරිසරයන් නිර්මාණය කිරීම, කාන්තාවන්ගේ අවශ්‍යතාවයන්ට අනුකුල වැඩ කිරීමේ ක්‍රමවේදයන් හඳුන්වා දීම, ඇඟළුම් ක්ෂේත්‍රයේ රැකියා සඳහා

සමාජ පිළිගැනීම වැඩි කිරීම, සහ ඇඟළුම් ක්ෂේත්‍රයේ රැකියා සඳහා වෘත්තීමය තත්වයක් ලබා දීම මේ සඳහා ගත හැකි ක්‍රියාමාර්ග කීපයකි.

***තරඟකාරී වැටුප් පිරිනැමීම :*** අනෙකුත් තරඟකාරී අංශයන් සමඟ තරඟ කිරීමට නම් තරඟකාරී වැටුපක් ප්‍රදානය කිරීමට ඇඟළුම් අංශයට සිදු වේ. එමෙන්ම වඩා ආකර්ෂණීය සහ ප්‍රසන්න වැඩ බිම් නිර්මාණය කිරීමත් කාන්තාවන් මෙම අංශයට නැඹුරු කර ගැනීම සඳහා කළ යුතු වේ. පිරිසිදු පානීය ජලය, සනීපාරක්ෂක පහසුකම් වැනි මූලික පහසුකම් මෙන්ම ආහාර ගැනීමට සහ විවේක ගැනීමට ප්‍රමාණවත් පහසුකම්, පිරිසිදු හා ක්‍රමවත් වටපිටාවක්, වැඩ කිරීමට පහසු වන උෂ්ණත්ව හා ආලෝක තත්වයන් සපයා දීම මෙන්ම වෙනත් සමාජයීය ක්‍රියාකාරකම් (සංස්කෘතික හා විනෝදාත්මක උත්සව) සංවිධානය කිරීම වැනි දේ මෙහිදී වැදගත් වේ.

***කාන්තාවන්ගේ අවශ්‍යතාවයන්ට අනුකූල වැඩ කිරීමේ ක්‍රමවේදයන් හඳුන්වා දීම :*** ශ්‍රම හිඟතාවයෙන් වඩාත්ම පීඩා විඳින රැකියා කාණ්ඩය වන්නේ වැඩි වශයෙන් කාන්තවන් සේවා නියුක්තව සිටින 'මැෂින් ක්‍රියාකරුවන්' යන කොටස යන්න සැලකිල්ලට ගෙන ඔවුන්ගෙ අවශ්‍යතාවයන්ට අනුකූල වැඩ කිරීමේ ක්‍රමවේදයන් හඳුන්වා දීම ඉතා වැදගත් වේ. නම්‍යශීලී වැඩ කිරීමේ වේලාවන්, නිවසේ සිට වැඩ කිරීම, සහ වැඩ බෙදා ගැනීම වැනි විකල්ප ක්‍රම මෙන්ම මාතෘ නිවාඩු, දිවා සුරැකුම් පහසුකම් ලබා දීම වැනි පියවර මෙහිදී වැදගත් වේ.

***වඩා යහපත් සමාජ පිළිගැනීමක් නිර්මාණය කිරීම :*** ඇඟළුම් අංශයේ රැකියා සඳහා හොඳ සමාජ පිළිගැනීමක් සහ අවබෝධයක් ඇති කිරීම මෙම ගැටළුව විසඳීමේදී ගත යුතු වැදගත් පියවරකි. කර්මාන්තය තුළ ක්‍රියාත්මක වන ප්‍රධාන ආයතන මෙන්ම සංවිධාන මඟින් ද මේ සඳහා ක්‍රියාත්මක වී ඇති ආකාරය දැනටමත් දැක ගත හැක. Women Go Beyond, අභිමානී වැනි වැඩ සටහන් මේ සඳහා උදාහරණ වේ. කෙසේ වෙතත් තවමත් ඇඟළුම් කර්මාන්තය ආශ්‍රිත රැකියා කෙරෙහි අපකීර්තිමත් අදහසක් සමාජය තුළ දැකිය හැක. ඇඟළුම් කර්මාන්තයේ සේවා නියුක්ත කාන්තවන් රටේ ආර්ථික සංවර්ධනයට දක්වන දායකත්වය පිළිබඳව සමාජය දැනුවත් කල යුතු අතර ඔවුන්ගේ ශ්‍රමය ඇගයීමට කටයුතු කළ යුතුය.

***ඇඟළුම් කර්මාන්තයේ පහළ ස්ථර වල රැකියා සඳහා වෘත්තීමය පිළිගැනීමක් ලබා දීම සහ පැහැදිලි වෘත්තීය ගමන් මඟක් සකස් කිරීම :*** මැෂින් ක්‍රියාකරවන්නන් වැනි රැකියා සඳහා පිළිගත් වෘත්තීමය සුදුසුකම් සකස් කිරීම සහ සහතික පත් පිරිනැමීම කාන්තාවන් එම රැකියා වලට ආකර්ෂණය කිරීමට නිසැකයෙන්ම හේතු වනු ඇත. තවද පුද්ගල නිපුණතා හඳුනා ගැනීම තුලින් පැහැදිලි වෘත්තීය මාර්ගයන්ට යොමු කිරීම මෙන්ම රැකියා උසස් වීම් නිසියාකාරව ලබා දීම ද කල යුතු වේ. මෙමගින් ඉහල අධ්‍යාපනික සුදුසුකම් ඇති කාන්තාවන්ද මෙම ක්ෂේත්‍රයට ආකර්ෂණය කර ගැනීමට හැකි වනු ඇත.

ශ්‍රී ලංකා ඇඟළුම් ක්ෂේත්‍රය තුල මහා පරිමාණ මෙන්ම මධ්‍යම හා කුඩා පරිමාණ ආයතන ද ක්‍රියාත්මක වේ. මෙම සියලූම ආයතන වලට ඉහත සඳන් කරන ලද පියවරයන් ගැනීමට හැකියාවක් නොමැති වනු ඇත. විශේෂයෙන්ම මෙම පියවර අනුගමනය කිරීමට අවශ්‍ය මූල්‍යමය ප්‍රතිපාදන සපයා ගැනීමේ අපහසුතාවය මේ සඳහා හේතු වේ. කෙසේ නමුත් අනෙකුත් අංශ වලින් එල්ලවන දැඩි තරඟකාරීත්වයත් කර්මාන්තයේ අනාගතයත් සළකා ඇඟළුම් ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක වන සෑම ආයතනයක්ම හැකි පමනින් මෙම ගැටළුව නිරාකරණය කර ගැනීමට උනන්දු විය යුතු අතර ඒ සඳහා පූර්ණ දායකත්වය ද ලබා දිය යුතුය. ආයතනික මට්ටමෙන් ගන්නා ක්‍රියාමාර්ග මෙන්ම කර්මාන්තයක් වශයෙන් සාමූහිකව ගන්නා ප්‍රයත්නයන් ද එක ලෙස වැදගත් වේ.

ඇඟළුම් කර්මාන්තයේ සාර්ථකත්වය සහ තිරසාරභාවය ශ්‍රී ලංකා ආර්ථිකයට අතිශයින් වැදගත් වේ. රැකියා උත්පාදනයේ සහ විශේෂයෙන්ම මෙම ක්ෂේත්‍රයේ සේවා නියුක්ත කාන්තාවන් සවිබල ගැන්වීමේදී ඇඟළුම් කර්මාන්තය මාහැඟි කාර්ය භාරයක් ඉටු කරයි. ඇඟළුම් කර්මාන්තයට, එහි සේවා නියුක්තව සිටින කාන්තාවන් ආර්ථිකමය වශයෙන්  ස්වාධීන කිරීමටත් ඔවුන්ගෙ යහ පැවැත්ම උසස් කිරීමටත් අවශ්‍යය පරිසරය නිර්මාණය කිරීමට හැකියාව ඇත. මෙම හේතුන් නිසා ශ්‍රී ලංකාවේ ඇඟළුම් කර්මාන්තයේ සේවා නියුක්ත කාන්තාවන්ගේ ගරුත්වය ආරක්ෂා කරමින් මෙම කර්මාන්තයේ ඉදිරි අනාගතය සුරක්ෂිත කීරීම ආර්ථික වශයෙන් මෙන්ම සමාජයීය වශයෙන්ද ඉතා වැදගත් වේ.

**An Emperical Investigation of Labour Shortage in the Manufacturing Sector in Sri Lanka  යන පර්යේෂණය මහාචාර්ය අතුල රණසිංහ (කොළඹ විශ්ව විද්‍යාලය) , සුනිමලී මදුරාවල (ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය)  ආචාර්ය ජෙන් ජේ සූ, සහ තුශාර සේනාධීර (ග්‍රිෆිත් විශ්ව විද්‍යාලය ඕස්ට්‍රේලියාව) යන අය විසින් Australian Awards Fellowship 2016  වැඩසටහන යටතේ සිදු කරන ලදී.